කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජහා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2012

2015 ජූනි/ ජූලි

**BMGT E 3015/ BMG 303.2 - උපායශීලී කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

**පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

## <u>ගෝල්ඩ් කිහෝටල් සමාගම</u>

ගෝල්ඩ් කි හෝටල් සමාගම, සත්කාර ක්ෂත්‍රයේ විසි වසරක් සේවයේ නියතුව සිට ඉන් ඉවත්වී රණතුංග මහතා විසින් 1985 වසරේදී පිහිටවූ ආයතනයකි. බෙන්තොට ප්‍රදේශයේ කාමර 100 කින් යුතුව මූලිකව විදේශ සංචාරකයන් සඳහා නවාතැන් පහසුකම් හා වෙරළ ආශ්‍රිත විනොදාස්වාද ක්‍රියාකාරකම් සැපයීම තම මූල් ව්‍යාපාරික කටයුත්ත ලෙස මෙම ව්‍යාපාරය අරම්බකරන ලදී. නව වෙරළ ආශ්‍රිත ක්‍රියාකාරකම් වන, මසුන් නැරබීම සඳහා කිමිදීම, සුළං බෝට්ටු පැදවීම, රළමත ලිස්සයාම, මුහුද මත ලිස්සායාම, හා පැරෂූට් පැදවීම ආදී විනොදාස්වාද ක්‍රියාකාරකම් හඳුන්වා දීමත් සමග වැඩි විදේශ සංචාරකයන් ප්‍රමාණයක් තමන් වෙත අද්දවා ගැනීමට සමාගමට හැකිවිය. එමගින්, සමාගමේ ලාභදයිත්වය වැඩිවූ අතර, තම ව්‍යාපාරික කටයුතු තවදුරටත් පුළුල් කිරීම සඳහා කටයුතු කරන ලදී. මූලිකව තම හෝටලයේ ධාරිතාවය පුළුල් කිරීම් සිදුකරන ලදී. ඒ අනුව, තමධාරිතාවය කාමර 300 දක්වා වැඩි කළේය. එසේම, නව හෝටල් දෙකක් ත්‍රිකුණාමලය හා හලාවත මුහුද ආශ්‍රිත ප්‍රදේශ වල ගොඩනගන ලදී. එම නව හෝටල් තුළද මූලිකව බෙන්තොට හෝටලයේදී සපයනලද විනෝදාස්වාද සේවා ලබාදීමට තීරණය කරන ලදී. මීට අමතරව බෙන්තොට හෝටලය තුළ ලබාදෙන සත්කාරක සේවා තවදුරටත් පුළුල් කළේය. ඒ අනුව, ආයුර්වේද සත්කාර හා මනෝ සත්කාර සේවා ලබාදීමට කටයුතු කළේය.

මෙම නව උපාය මාර්ග නිසා තවදුරත් සමාගමේ කටයුතු පුළුල් වූ අතර, එමගින් කර්මාන්තය තුළ සැලකිය යුතු ස්ථානයක් ලබාගැනීමට සමාගමට හැකි විය. වර්තමානය වන විට රු. මි. 1200 වාර්ෂික පිරවටුමක්, රු.මි. 750 ලාභයක්, සහ 12,000 මානව සම්පතක් සහිතව කටයුතු කරන ආයතනයක් බවට සමාගම පත්වී ඇත. මේ පිලිබඳව කළමනාකරණ මණ්ඩලය ඉතා සතුටට පත්වී ඇති අතර, ඉදිරි අනාගතය සඳහා කුමන උපාය මාර්ග අනුගමනය කළ යුතුද යන්න සළකා බලමින් සිටියි.ඉදිරි අවුරුදු පහක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කිරීම කළ යුතු බවට කළමනාකරණ මණ්ඩලය තම එකගතාවය ඒකමතිකව පළකරන ළදී. විශේෂයෙන් සමාගම කර්මාන්තය තුළ ප්‍රමුඛයා බවට පත්කිරීම අරමුණු කොටගෙන මෙම සැලසුම්කරණය සිදුකලයුතු බව ඔහුන්ගේ අදහස වේ. කෙසේ වෙතත් මේ සඳහා අනුගමනය කළයුතු උපායමාර්ග පිළිබද කළමනාකරණ මණ්ඩලය තුළ විවිධ අදහස් ඇත.

සෙ

එක්පාර්ශවයක් පවසන්නේ තමන් විවිධාංගීකරණ උපාය මාර්ගයක් තෝරාගත යුතු බවයි. ඒ අනුව, සංචාරක ක්ෂත්‍රයේ නව සේවාවන් වන, පරිසර සංචාරක සේවා (Eco Tourism), අභියෝගශීලී සංචාරක සේවා (Adventure Tourism), සංස්කෘතික සංචාරක සේවා (Cultural Tourism) ආදී ලෙස තම සේවා ජාලය පුළුල් කරමින්, ඒ ඒ සංචාරක සේවාසැපයීම සඳහා වෙන වෙනම හෝටල් පිහිටුවීම් කලයුතු බව එක් පාර්ශවයක අදහස වේ. ඔහුන් පෙන්වා දෙන්නේ, සමාගම කර්මාන්තය තුළ අත්පත්කගෙන ඇති පිළිගැනීම නිසා පාරිභෝගිකයන් අද්දවා ගැනීම පිළිබද ගැටළුවක් ඇති නොවන බවයි.

තවත් පාර්ශවයක අදහස වන්නේ, ඉහළ ප්‍රාග්ධනයක් අවශ්‍ය කරන විවිධාංගීකරණ උපායමාර්ගයකට වඩා වෙළෙඳපොලවිවිධාංගීකරණ උපායමාර්යගක් වඩා යෝග්‍ය බවයි. ඒ අනුව, දේශීය සංචාරකයන් සඳහා තම සේවා විවෘත කොට , වැඩි විභවතාවයක් සහිත සංචාරක වෙළඳපොළවල් වන ඉන්දියාව හා චීනය ඉල්ලක කොට තීව්‍ර ප්‍රචාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කළයුතු බවයි.ඔහුන් දක්වන්නේ, දැනට ඌන උපයෝජනයේ පවතින ත්‍රිකුණාමලයේ හා හලාවත හෝටල් වල ධාරිතාවය මෙමගින් පූර්නව උපයෝජනය තත්වයට පත්කරගත හැකි බවයි.

අනෙක් කණ්ඩායම ඉදිරිපත් කරන්නේ මීට හාත්පසින්ම වෙනස් අදහසකි. ඔහුන්ගේ අදහස වන්නේ, කර්මාන්තය තුළ තරගකාරීත්වය අඛණ්ඩව ඉහළ යන නිසා වෙනත් ව්‍යාපාරික කටයුතු කෙරෙහි අවධානය යොමුකළ යුතු බවයි. ඒ අනුව, ඔහුන් ඉදිරිපත් කරන්නේ, සංචාරක කර්මාන්තය හා ආශ්‍රිත කටයුතු වන, සංචාරකසමුළු පැවැත්වීම, සංචාරකයින් සඳහා සුකෝපභෝගී ප්‍රවාහන සේවා සැපයීම, හාවිදේශ සංචාරක වැඩසටහන් සංවිධානය කිරීම වැනි ක්ෂේත්‍රවලට තම කටයුතු ව්‍යාප්ත කළ යුතු බවයි.

කළමනාකරණ මණ්ඩලය විසින් ඉදිරිපත් වී ඇති මේ එක් එක් විකල්ප උපායමාර්ගයන් පිලිබදව සළකා බලමින් සිටියි. මින් එක් උපායමාර්ගක් සංවිධානයේ තත්වය, කර්මාන්තයේ තත්වය, හාසංවිධානයේ අරමුණ වන කර්මාන්තයේ ප්‍රමුකයා බවට පත්වීමේ අරමුණ යන සාධක මත වඩා යෝග්‍ය

උපායමාර්ගය තෝරා ගැනීම හා ඒ අනුව ඉදිරි පස් වසර සඳහා සංයුක්ත සැලැස්ම සකස්කිරීමට අදහස් කර සිටියි.

මෙයකලපිත සිද්ධියකි.

ප්‍රශ්න.

(අ) ගෝල්ඩ් කි සමාගම විසින් මේ දක්වා අනුගමනය කර ඇති විවිධ උපායමාර්ගයන් මොනවද යන්න හඳුනාගෙන ඒවා සමාගමේ සාර්ථකත්වය සඳහා කොතෙක් දුරට දායක වී ඇත්ද යන්න විස්තර කරන්න.

( ලකුණු 14)

(ආ) සමාගමේසංයුක්ත සැලැස්ම සඳහා ඉදිරිපත් වී ඇති විවිධ උපායමාර්ගයන් අතුරින් වඩා යෝග්‍ය උපායමාර්ගය කුමක්ද යන්න හේතු සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 14)

(මුළු ලකුණු 28)

(02) (අ) "උපායශීලී කළමණාකරණය" යන්න නිර්වචනය කර, පලදායිඋපායශීලී කළමණාකරණය තුළින් ආයතනයන්ට ලබාගත හැකි ප්‍රතිලාභ දක්වන්න.

(ලකුණු 9)

(ආ) උපායශීලී කළමනාකරණයේදී , දැක්ම, මෙහවර, අගයකිරීම් හා පරමාර්ථ පිහිටුවීමේ වැදගත්කම පෙන්වාදෙන්න.

(ලකුණු 9)

(මුළු ලකුණු 18)

(03) (අ) පරිසරය පිළිබඳ ඇගයීමකදී සළකා බැලිය යුතු මූලික පරිසර සාධකයන් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 9)

(ආ) කල්පිත සන්විධානයක් සඳහා බාහිර සාධක ඇගයීමේ න්‍යාසයක් ගොඩනගන්න.

(ලකුණු 9)

(මුළු ලකුණු 18)

(04) (අ) පෝර්ටගේ පංචබල ආකෘතිය කෙටියෙන් දක්වා සංවිධානයක වෙළඳපොල තරගකාරීත්වය ඇගයීම සඳහා එහිවන යෝග්‍ය අයෝග්‍යතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 9)

(ආ) ආයතනයක් සඳහා උපායමාර්ග තෝරාගැනීමේදී සළකා බැලියයුතු සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 9)

(මුළු ලකුණු 18)

(05) (අ) සංවිධානයක් සඳහා වන විකල්ප උපායමාර්ගයන් ඇගයීම සඳහා යොදාගත හැකි ආකෘතියක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 9)

(ආ) වර්ධන හෝ ව්‍යාප්ත උපායමාර්ගයක් යටතේ ආයතනයන් අනුගමනය කරන විවිධ උපායයන් සාකච්චා කරන්න.

(ලකුණු 9)

(මුළු ලකුණු 18)

(06) (අ) කඩිනම් වර්ධන උපායමාර්ගයේ හා විවිධාංගීකරණ උපායමාර්ගයේ විවිධ ස්වරූප කෙටියෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 9)

(ආ) ආයතනයකට හැකිලීමේ උපායමාර්ගයක් අනුගමනය කිරීමට සිදුවෙන අවස්ථා මොනවද යන්න විස්තර කරන්න.

(ලකුණු 9)

(මුළු ලකුණු 18)

(07) (අ) උපායමාර්ග ක්‍රියාත්මක කිරීම හා සංවිධාන ව්‍යුහය අතර වන සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 9)

(ආ) නිෂ්පාදන පෙළ හා නිෂ්පාදන මිශ්‍රය සම්බන්ධයෙන් ආයතනයකට අනුගමනය කළ හැකි විවිධ විකල්පයන් මොනවද?

(ලකුණු 9)

(මුළු ලකුණු 18)

(08) (අ) අලවිකරණ කර්යශ්‍රිතය සඳහා උපායශීලී තීරණ ගතයුතු ප්‍රධාන ක්ෂේත්‍ර පැහැදිලි කරන්න.

(ලකුණු 9)

(ආ) ආයතනයක උපායමාර්ගික කර්යසාධනය ඇගයීම සඳහා යොදාගත හැකි ප්‍රමාණාත්මක හා ගුණාත්මක නිර්ණායක කෙටියෙන් විස්තර කරන්න.

( ලකුණු 9)

(මුළු ලකුණු 18)